# විස්තෘත පවුලේ අභාවය

සිංහලයන්ගේ ආවාහ විවාහවල ප්‍රධාන පදනමක් වුයේ සහේට ගැනීම ය. සහේට ගැනීම යනු සහකාරියක හෝ සහකරුවකු හෝ ලබාගැනීම ය. සහකරුවකු හෝ සහකාරියක හෝ ලබාගතයුත්තේ තම රැකියාව කරගෙනයෑමට ය. වෙනත් රැකියාවක හෝ වෙනත් සවයං රැකියාවක හෝ නිරතවන අයකු සහේට ගැනීමෙන් තමන් දන්නා රැකියාව කරගෙන යෑමට බාධා ඇතිවන බව පැහැදිලි ය. එබැවින් එකල තිබූ රාජකාරි ක්‍රමය යටතේ කුඹුරු වැඩවල හෝ වෙනත් වැඩක හෝ යෙදෙන්නකු සහකාරියක ලබාගැනීම බොහෝවිට කෙරුණේ ඒ රැකියාව ම කරන පවුලකින් ය.

මෙහි දී රැකියාව යන වචනය යොදාගනු ලැබුව ද, ඒ මෙකල මෙන් වැටුපට කරන රැකියාවක් නො වී ය. වැටුප මූලික වශයෙන් ම බටහිර ධනපති ක්‍රමයට අයත් වුවකි. ඉන් කියැවෙන්නේ වෙනත් සමාජවල කිසියම් වූ ආකාරයක වැටුප් ගෙවීමක් කිසිම විටෙක නොසිදු වූ බව නො වෙයි. එහෙත් සාමාන්‍යයක් ලෙස වැටුප ක්‍රියාත්මක වන්නේ ධනෝශ්වර ක්‍රමයෙහි ය. එකල කුඹුරට හෝ හේනට යන ගොවියා තමන්ගේ වැඩක් කෙළේ ය. ඒ අනෙකකුට කළ සේවයක් නො වී ය. තම තමන් තම පවුලේ හෝ ගමේ හෝ කටයුතු කළ බැවින් ස්වාමි සේවක ක්‍රමයක් එකල නො වී ය.

ඉඩකඩම්වල අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් ද එකල නො විණි. රජතුමා වුව ද සිංහල බෞද්ධ ක්‍රමය යටතෙහි ඉඩම්වල භාරකරු පමණක් විය. ඉඩම්වල පෞද්ගලික අයිතිය යන සංකල්පය සිංහල සමාජයෙහි නො වී ය. වැවෙන් වතුරගෙන කුඹුරු කිරීමේ දී වැවට ආසන්න කුඹුර සැමදාමත් කෙළේ එකම පවුලක් නො වේ. එසේ කෙළේ නම් වැවෙන් ඈතින් පිහිටි කුඹුරු කරවුවනට අසාධාරණයක් වීමට තිබුණි. කුඹුරු කිරීම එක එක පවුල් අතරෙහි මාරුවිය. එමගින් සෑම පවුලකට ම වැවට ආසන්න කුඹුරෙහි වැඩකිරීමට වාරයක් උදාවිය. මේ ක්‍රමය අද පවා ඇතැම් ගොවි ජනපදවල ක්‍රියාත්මක වෙයි.

ඉඩම්වල අයිතියක් නොතිබූ හෙයින් බ්‍රිතාන්‍යීන්ට පසු කලෙක මුඩුබිම් ආඥාපණත යටතේ උඩරට වැසියන් ජීවත් වූ ඉඩම් කොල්ල කෑමට හැකිවිය. ඉඩම්වල අයිතියක් පෙන්විය නොහැකි ඉඩම් රජයට පවරාගැනීමට නියෝගකිරීමෙන් උඩරට වැසියන්ට අසාධාරණයක් සිදුවිය. එසේ කොල්ල කෑ ඉඩම්වල බ්‍රිතාන්‍යීහු පළමුව කෝපි සහ පසුව තේ වැවුවා පමණක් නොව ඒ සඳහා දකුණු ඉන්දියාවෙන් ශ්‍රමිකයන් ද ගෙන්වූහ.

ලංකාවේ තිබූ නිෂ්පාදන ක්‍රමය කිසිසේත්ම යුරෝපයේ තිබූ වැඩවසම් ක්‍රමය නො වී ය. යුරෝපීය වැඩවසම් ක්‍රමය යටතේ ඉඩම්වල අයිතිය රජුට, රදළයන්ට හා පල්ලියට අයත්විය. එහි අයිතිය යන සංකල්පය විය. ඒ ඉඩම්වල ඉඩම් නොමැති අය වැඩකෙළේ ප්‍රවේණිදාසයන් ලෙස ය. ඉඩම්වල අයිතිය මාරුවීමේ දී ඒවාහි වැඩකළ දාසයන්ගේ අයිතිය ද මාරුවිය. දාසයෝ ඉඩමට බැඳී සිටියහ.

ලංකාවේ ද නින්දගම් විහාර දේවාලගම් ආදී වශයෙන් පවරාදුන් ඉඩම් නොමැති දැයි කිසිවකුට ප්‍රශ්නකළ හැකි ය. ඒ ඉඩම්වල පවා ඒ ඒ විහාරයට හෝ තනතුරු දැරුවන්ට ලැබුණේ අයිතියක් නොව භාරකාරත්වයකි. රජුට ද තිබුණේ භාරකාරත්වයක් බැවින් අනෙක් අය ගැන කීමට දෙයක් නො වී ය. රජුට රාජකාරි ක්‍රමය යටතෙහි යම් සේවයක් කළවුනට නිෂ්පාදන කාර්යයක් කිරීමට නොහැකි වූ විට හෝ කළ සේවයට ගරුකිරීමක් ලෙස හෝ ඇතැමුනට නින්දගම් ලැබුණි. එමෙන් ම විහාර දේවාල (කෝවිල් නො වේ) පවත්වාගෙන යෑමටත් ඉඩකඩම් අවශ්‍ය විය. විහාර සාංඝික ක්‍රමයට පූජාකළ බැවින් අයිතියක් යන සංකල්පය නො වී ය. ඒ වෙනස් වූ අවස්ථා සිංහල ඉතිහාසයෙහි නැතිවා නො වේ. මෙහි සඳහන්වන්නේ සාමාන්‍යය මිස විශේෂය නො වේ.

අප දැන් සැලකිය යුත්තේ ඉහත සඳහන් (නිෂ්පාදන) ක්‍රමය යටතේ ආවාහ විවාහ හා පවුල යන ඒකකය ක්‍රියාත්මක වුයේ කෙලෙස ද යන්න ය. එකල තිබියේ සමාජයීය සාමූහිකත්වයක් බව කලින් සඳහන්කෙරී ඇත. මිනිසුන් ගමට අයිති වුවා මිස ගම මිනිසුන්ට අයිති නො වී ය. ගම යන්න රටෙහි පාලන ව්‍යුහයෙහි කුඩාම ඒකකය විය. ගමෙහි මිනිසුන් ජීවත්වුයේ පවුල්වල ය. එදා පවුල අද වචනවලින් කියන්නේ නම් විස්තෘත පවුලක් (extended family) විය. අද පවුලට කියැවෙන්නේ න්‍යෂ්ටික පවුල (nuclear family) කියා ය.

© Prof. Nalin De Silva

විස්තෘත පවුලෙහි සාමාජිකයන් වූයේ මව, පියා හා දරුවන් පමණක් නො වේ. ආච්චි සීයා නැන්දා මාමා ආදීහු ද විස්තෘත පවුලෙහි සාමාජිකයෝ වූහ. ඒ සමාජයීය සාමූහිකත්වය යටතේ ය. පැරණි යුරෝපීය වැඩවසම් සමාජයෙහි ද වූයේ විස්තෘත පවුල් ය. එහෙත් එපමණකින් ලංකාවේ එකල සමාජය යුරෝපීය සමාජයට සමානවන්නේ නො වේ. විස්තෘත පවුල බටහිර යුරෝපයේ බිඳවැටුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග ය. වෙනත් වචනවලින් කියන්නේ නම් බටහිර සමාජයීය පෞද්ගලිකත්වය ඇතිවීමත් සමග ය. පෞද්ගලිකත්වය ඉස්මතු කෙරුණු සමාජයක විස්තෘත පවුල පමණක් නොව මිනිසුන් ඉඩම්වලට බැඳතැබීමත් ක්‍රියාත්මක නො වී ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පසුකලෙක ධනේශ්වර ක්‍රමය බිහිවූයේ මේ පසුබිමෙහි ය. ඉඩම්වල සාමූහික ව ඉඩම්වලට අයත් මිනිසුන් වැඩකරනු වෙනුවට කර්මාන්ත ශාලාවක තනි තනිව කර්මාන්ත ශාලාවට අයිති නොවී තම ශ්‍රමය විකුණන මිනිසුන් ඇතිවූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සමාජයීය පෞද්ගලිකත්වය මුල්කරගෙන ය.

යුරෝපීය වැඩවසම් ක්‍රමයෙහි ඉඩමේ වැඩකළ තැනැත්තකුට ඉඩමෙන් අයින් වී (අස් වී) වෙනත් ඉඩමකට යැමේ හැකියාවක් නො වී ය. එසේ ම සාමාන්‍යයෙන් ගතහොත් ඉඩමකින් එක් පුද්ගලයකු අස්කිරීමක් ද නො වී ය. එහෙත් කර්මාන්ත ශාලාවක එසේ නො වේ. කර්මාන්ත ශාලාවක, එනම්, යම් ව්‍යාපාරයක, ආයතනයක, මිනිසකු සේවය සඳහා බඳවාගැණෙන්නේ තනි පුද්ගලයකු ලෙස ය. ඒ පුද්ගලයාට අවශ්‍ය නම් ඒ ආයතනයෙන් අස් වී වෙනත් ආයතනයක රැකියාවක් ලබාගැනීමේ අවස්ථාව වෙයි. එමෙන් ම ව්‍යාපාරය හිමියන්ට අවශ්‍ය නම් එක් සේවකයකු නෙරපාදැමීමේ හැකියාව ද වෙයි.

අප මෙහි දී අවධාරණයකරන්නේ බටහිර යුරෝපීය ධනේශ්වර ක්‍රමය විසින් පුද්ගලයා ඉස්මතුකෙරුණා නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පුද්ගලයා ඉස්මතුවීම හේතුවෙන් ධනේශ්වර ක්‍රමය බිහිවීමට මගපෑදුණා යන්න ය. බටහිර විද්‍යාවද පැන නැගීමට හේතුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග ඇති වූ චින්තන විප්ලවය බව අපි සඳහන්කර ඇත්තෙමු. එය ජෝසප් නීඩ්හම් පඬිවරයා පළකර ඇති මතයට වඩා වෙනස්වූවකි. ඔහු කියා ඇත්තේ බටහිර විද්‍යාව ඇතිවීමට හේතුව ධනේශ්වර ක්‍රමය බව ය.

පුද්ගලයා ඉස්මතුකෙරී කර්මාන්තශාලා ඇති වී ඒ ඇති වූ තැන්වලට පුද්ගලයන් ගෙන්වාගැනීමට ක්‍රියාකිරීමේ දී විස්තෘත පවුල තවදුරටත් පවත්වාගෙන යැමේ හැකියාවක් නොමැති විය. පෞද්ගලිකත්වය ඉස්මතුකිරීම ඔස්සේ එවැනි කර්මාන්තශාලා පවත්වාගෙන යැමේ හැකියාව උදාකර තිබුණි. කර්මාන්තශාලාවක හෝ එවැනි වෙනත් ආයතනයක සේවයට පැමිණි අයට සිදුවූයේ එක්කෝ පවුලෙන් ඈත් වී ආයතනයෙහි සේවයට පැමිණ ඉඩක් ලද විටෙක ආපසු තම ගම්ප්‍රදේශයට ගොස් සුළු කාලයකට පවුලත් සමග ජීවත් වී නැවතත් සේවයට පැමිණීමට ය. එසේත් නැතහොත් පවුලෙන් තමන්ට ඉතාම සමීප අයත් සමග කර්මාන්තශාලාව පිහිටි ප්‍රදේශයෙහි ජීවත්වීමට පැමිණීමට ය. පළමු ක්‍රමයෙන් විස්තෘත පවුල පවත්වාගෙන යැමට හැකිවිය. දෙවැනි ක්‍රමය යටතෙහි විස්තෘත පවුල බිඳවැටී න්‍යෂ්ටික පවුල ඇතිවීමට ඉඩකඩ සැලසිණි.

අප කවුරුත් අද දන්නා පරිදි සිදුවූයේ දෙවැන්න ය. පළමු ක්‍රමය ප්‍රායෝගික නොවීමත් සමාජයීය පෞද්ගලිකත්වය ඉස්මතුවීම ඔස්සේ එයට එතරම් ඉඩක් නොතිබීමත් හේතුවෙන් විස්තෘත පවුල වෙනුවට න්‍යෂ්ටික පවුල ඇතිවිය. එහෙත් අද වන විට බටහිර රටවල න්‍යෂ්ටික පවුල පවා බොහෝවිට ක්‍රියාත්මක වන්නේ නාමික ව ය. අද පවුල යන්න ක්‍රමයෙන් අභාවයට යන සංකල්පයකි. ඊනියා වික්ටෝරියානු සදාචාරය ගැන කතාකරන අය පවුලේ විකාශය අමතක කරති. සදාචාර ගැන කතාකිරීමට පළමුව අපි පවුලේ විකාශය තේරුම්ගැනීමට උත්සාහකරමු.

කර්මාන්තශාලා හා වෙනත් එවැනි ආයතන බටහිර ඇතිවූයේ නගර වටා ය. එසේත් නැත්නම් එවැනි ආයතන වටා නගර ඇතිවිය. ඒ සමග සිදුවූයේ ජනයා ගම්වලින් ඉවත් වී නගරවල පදිංචියට පැමිණීම ය. ඒ සමග ගම පාළුවිය. ද ලොස්ට් පැරඩයිස් නම් ඉංගිරිසි කාව්‍යයෙහි විස්තරකෙරෙන්නේ මේ සිදුවීම ය. (මේ කාව්‍යය පාළුගම නමින් සිංහලට අනුවර්තනයකෙරී ඇත) මිනිසුන් එසේ පැමිණියේ න්‍යෂ්ටික පවුල සමග ය. කර්මාන්තශාලාවල ආරම්භයේ දී ඉතා කෲර ලෙස පිරිමින් පමණක් නොව ගැහැණු හා ළමයි ද සේවයේ යොදවනු ලැබූහ. සේවයකිරීම සඳහා නිශ්චිත

© Prof. Nalin De Silva

කාලසීමාවක් නො වී ය. ඒ ආයතනවල සේවයකෙරුණේ තනි තනි ව  බැවින් සේවකයන්ට එහි දී කළහැකි වූයේ ස්වාමින්ගේ කැමැත්තට යටවීම පමණ ය.

මේ තත්ත්වයෙන් ගොඩඒම සඳහා සේවකයන්ට එකතුවන්නට සිදුවිය. අද පවත්නා වෘත්තීය සමිතිවලත් පසුව මාක්ස්වාදී විකාර ප්‍රවාදවලත් ආරම්භය එසේ සිදුවිය. මෙහි දී සඳහන්කළ යුතු වැදගත් කරුණක් වෙයි. එනම් කර්මාන්තශාලාවල හා වෙනත් ආයතනවල සේවකයන් ඒකරාශී වූයේ ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පටහැණි ව බව ය. එසේ දහස්ගණනින් එකතුවීම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි සමාජයීය පෞද්ගලිකත්වයට විරුද්ධ ය. ඒ පදනම්වන්නේ සමාජයීය සාමූහිකත්වය මත ය. එනම් කතෝලික චින්තනය මත ය. බටහිර යුරෝපයේ කර්මාන්තශාලාවල සේවකයන්ට ආපසු කතෝලික චින්තනය වෙතට යැම හැර වෙනත් විකල්පයක් නො වී ය. එහෙත් එය ඉතාමත් කෘත්‍රිම වූවක් විය. සමාජය සමස්තයක් ලෙස බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත යැපෙද්දී එහි කොටසකට ආපසු කතෝලික චින්තනය වෙත යා හැකි නො වේ. ඒ කෘත්‍රිමභාවය නැතිකළ හැකිව තිබුණේ එක්කෝ පසුව වෘත්තීය සමිති බවට පත්වූ සංවිධාන ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වෙත යැමෙනි. නැත්නම් මුළු මහත් සමාජය ම සමාජයීය සාමූහිකත්වය අංගයක් කරගත් චින්තනයකට යැමෙනි.

කාල් මාක්ස් පඬිවරයා බලාපොරොත්තු වූයේ ආසන්න වශයෙන් ගත්කල දෙවැන්න සාක්ෂාත්කර ගැනීමට ය. ඔහු සඳහන්කළ උත්තර සමාජය හෙවත් කොමියුනිස්ට් සමාජය එවැන්නකි. එහෙත් ඒ සඳහා මුළු මහත් බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අත්හළ යුතු බව ඔහු වටහා නො ගත්තේ ය. එහි දී බටහිර විද්‍යාව හා තාක්ෂණය ද අත්හැර වෙනත් විද්‍යාවක් නිර්මාණයකරගැනීමට සිදුවෙයි. එහෙත් ඒ සමග කර්මාන්තශාලා ද කඩා වටෙහි. එවිට කම්කරුවන්ට ද පදනමක් නැතිවෙයි. මාක්ස්වාදය බලාපොරොත්තුවන්නේ කම්කරුවන් ඔස්සේ උත්තර සමාජයක් ඇතිකිරීමට ය. එහෙත් කම්කරුවනට පදනමක් ඇත්තේ සමාජයීය පෞද්ගලිකත්වය ඇති ග්‍රීක යුදෙව් චින්තනයෙහි ය. ඒ පදනම කැඩීම යනු කම්කරුවන් ද, කර්මාන්තශාලා ද, බටහිර විද්‍යාව හා තාක්ෂණය ද බිඳ වැටීම ය. එවැනි පරස්පර මත බිහි වූ මාක්ස්වාදය කඩාවැටීමත් ඊනියා උත්තර සමාජය ළඟාකරගත නොහැකි මිරිඟුවක් බවට පත්වීමත්, කෘත්‍රිම සෝවියට් සමාජය විසිරී යැමත් පුදුමයට කරුණු නො වෙයි. පුදුමය මෙතරම් විසංවාද තිබියදීත් සුළු පිරිසක් හෝ මාක්ස්වාදී මත ගිරා පෝතකයන් සේ පුනරුච්චාරණයකිරීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva